# ශ්‍රී ලංකාවේ
# විසම්මුතිය මර්දනය

ජූනි 2014




*අළුත්ගම ඇතිවූ ජාතිවාදී කෝලහයේ විපාක වාර්තා කිරීමට ගිය අල් ජසීරා හි මාධ්‍ය කණ්ඩායම කළහකාරී පිරිසකගේ ප්‍රහාරයට ලක් වූ ආකාරය අල් ජසීරාහි කොළඹ වාර්තාකාරිණිය විසින් විස්තර කරන ආකාරය. ඔවුන්ගේ හානියට පත් වාහනයද පසුබිමේ දිස්වේ. (ඡායාරූපය - අල් ජසීරා වීඩියෝ පටය)*

**INFORM**
**Human Rights Documentation Centre**
informcolombo@gmail.com

## ආවරණය කළ සිදුවීම්

**A.** අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස උල්ලංඝණය කිරීම්

**B.** සමාගමයේ නිදහස උල්ලංඝණය කිරීම්

**C.** එක්සත් ජාතීන්ගේ යුධ අපරාධ විමර්ශන මණ්ඩලය වෙත සාක්ෂි ලබා දෙන පුද්ගලයන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගන්නා බවට තර්ජනය කිරීම

**D.** විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ට මරණ තර්ජන, උද්ඝෝෂණය කළ ගුරුවරුන්ට සහ දෙමාපියන්ට ප්‍රහාර

**E.** ශිෂ්‍ය ක්‍රියාකාරකම් මර්දනය කිරීම

**F.** ආගමික නිදහස ප්‍රවර්ධනය කරන මානව හිමිකම් ආරක්ෂකයෙකුට තර්ජන

**G.** ජාතිවාදී කෝලහලයෙන් අනතුරට ලක් පුද්ගලයන්ට සහය වූ විපක්ෂයේ දේශපාලඥයෙකුට පහර දීම

*ඉන්ෆෝර්ම්ආයතනය1990දීආරම්භකරනලද්දේවිශේෂයෙන්මවාර්ගිකගැටුමසහයුද්ධයසන්දර්භයෙහිශ්‍රීලංකාවේමානවහිමිකම්තත්ත්වයනිරීක්ෂණයකරමින්කරුණුගොනුකිරීමටත් එමකරුණුලිඛිතසහවාචිකමැදිහත්වීම්හරහාප්‍රාදේශීයව, ජාතිකවසහජාත්‍යන්තරවවාර්තාකිරීමටත්ය.*
*එසේමසියඅයිතීන්නිරන්තරයෙන්සහක්‍රමවත්ලෙසකෙළෙසීමටලක්වනඅනෙක්ජන ප්‍රජාවන්සමගදඉන්ෆෝර්ම්ආයතනයකටයුතුකරයි.වර්තමානයේදීඉන්ෆෝර්ම්ආයතනයමැතිවරණනිරීක්ෂණය, මාධ්‍යනිදහසසහමානවහිමිකම්ආරක්ෂකයින්සම්බන්ධයෙන්සියඅවධානය යොමුකරතිබේ. ශ්‍රීලංකාවේකොළඹපිහිටාඇතිඉන්ෆෝර්ම්ආයතනයදේශීයක්‍රියාධරයින්, කණ්ඩායම්සහජාලයන්සමඟමෙන්මකලාපීයසහජාත්‍යන්තරමානවහිමිකම්ජාලයන්සමගසහයෝගයෙන්කටයුතුකරයි.*

## සාරාංශය:

2014 ජූනි මාසය ශ්‍රී ලංකාවේ ජනයාගේ මතකයේ රැඳෙන්නේ අලුත්ගම සහ බේරුවෙල ප්‍රදේශයේ ඇති වූ ජාතිවාදී ප්‍රචණ්ඩත්වයන් නිසාය. මේ සිදුවීමෙන් මුස්ලිම් ජාතිකයන් තිදෙනෙක් සහ එක් දමිල ජාතිකයෙක් මරණයට පත් වී 80දෙනෙකුට වැඩි ප්‍රමාණයක් තුවාල ලැබූ අතර විශාල වශයෙන් දේපල හානි සිදු විය. මෙම සිදුවීමෙන් වැඩි හානියකට මුහුණ දුන්නේ මුස්ලිම් ප්‍රජාවයි.මෙම කෝලහලයට වගකිව යුත්තේ බෞද්ධ අන්තවාදී කණ්ඩායමක් වන බොදු බල සේනාව බව පොදු පිළිගැනීම වූ අතර අධිකරණ අමාත්‍යවරයා සහ රජයේ වෙනත් අමාත්‍යවරු කිහිප දෙනෙක්ද ඒ බව ප්‍රකාශ කර සිටියේය. එයට හේතු වූයේ විශේෂයෙන්ම බොදු බල සේනාවේ නායකත්වය හොබවන ගලබොඩඅත්තේ ඥානසාර හිමියන් විසින් “මේ රටේ තවමක් තියෙන්නේ සිංහල පොලිසියක්, අපිට තවමත් තියෙන්නේ සිංහල හමුදාවක්, අදින් පස්සේ එක මරක්කලයෙක් හරි, වෙන පරයෙක් හරි එක සිංහලයෙකුට අත තියලා තිබුනොත් ඒ උන්ගේ අවසානයයි.” යනුවෙන් කරන ලද ජනතාව කුපිත කරවන ආකාරයේ කතාවයි. ප්‍රචණ්ඩක්‍රියාවන්ට හේතු විය හැකි නිසා මුස්ලිම් ආගමික නායකයන්ගේ සහ දේශපාලඥයින්ගේ ඉල්ලීම් නොසලකා මෙම කතාව පවත්වන ලද මහජන රැලිය, ඉදිරියට පවත්වාගෙන යාමට පොලීසිය විසින් ඉඩ ලබා දුන්නේය. දින කිහිපයකට පෙර මුස්ලිම් තරුණයන් කිහිප දෙනෙක් විසින් බෞද්ධ භික්ෂුවකට එල්ල කරන ලදැයි කියන පහර දීමක් මෙම කොල්හලයට හේතු වූ බව බොදු බල සේනාව සහ ඇතැම් රජයේ නිලධාරීන් ප්‍රකාශ කර සිටියහ. බෞද්ධ භික්ෂුවට නොව ඔහුගේ රියදුරුට පහර දී ඇති බව තවත් පිරිසක් කියා සිටියේය.මේ සිදුවීම සම්බන්ධයෙන් මුස්ලිම් තරුණයන් තිදෙනෙක් අත්තඩංගුවට ගෙන තිබුණි. අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග නොගැනීම පිළිබදව මෙම ප්‍රචණ්ඩක්‍රියාවන් ගෙන් අනතුරට පත් වූ ජනතාව සහ ඇසින් දුටු සාක්ෂිකරුවන් රජයට චෝදනා කළහ.

මෙම ජාතිවාදී කෝලහලය වාර්තා කිරීමට ගිය ජනමාධ්‍යවේදීන් සහ විපක්ෂයේ දේශපාලඥයෙක් බිය ගැන්වීම් වලට සහ ප්‍රහාරයන්ට ලක් විය. රාජ්‍ය පාලිත පුවත්පතක කර්තෘවරයෙකු විසින් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ ජනමාධ්‍යවේදියෙක් සහ ප්‍රමුඛ පෙළේ පුරවැසි ජනමාධ්‍ය වෙබ් අඩවියක් “ට්විටර්/සමාජ ජාල මිනී මරුවන්” ලෙස හදුන්වන ලදී. මෙයට හේතු වූයේ ජාතිවාදී කෝලහලය පිළිබද ප්‍රධාන ධාරාවේ ජනමාධ්‍ය හරහා ස්වාධීන පුවත් ආවරණයක් නොමැති තත්ත්වයක් තුළ තොරතුරු හෙළිදරව් කිරීමට මොවුන් උත්සහ කිරීමයි. මේ අතර මාධ්‍ය ආයතන වාරණයට ලක් කිරීම තැත් දැරුවේ යැයි විපක්ෂ නායක වරයා විසින් ආරක්ෂක අමාත්‍යංශයට චෝදනා කළේය.

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ප්‍රමුඛ පෙළේ රාජ්‍ය නොවන සංවිධානයක් විසින් දමිල ජනමාධ්‍යවේදීන් වෙනුවෙන් සංවිධානය කර තිබූ පුහුණු වැඩමුළුව කිසියම් නාදුනන කණ්ඩායමකගේ විරෝධතාවක් සහ පොලීසිය විසින් වැඩසටහනට ආරක්ෂාව සැපයීම ප්‍රතික්ෂේප කිරීම නිසා දෙවැනි වතාවටත් අවලංගු කිරීමට සිදු විය. ආරක්ෂාව සදහා කොළඹ ප්‍රධාන පෙළේ හෝටලයක රදවා තැබුණු පුහුණුවට සහභාගී වීමට පැමිණි ජනමාධ්‍යවේදීන්ව හෝටල් කළමණාකාරිත්වය විසින් මධ්‍යම රාත්‍රියේදී ඉන් ඉවත් කරන ලදී. යම්කිසි බලගතු පිරිසකගේ තර්ජනයක් එයට හේතු වූ බව ප්‍රකාශ විය. රාජ්‍ය නොවන සංවිධාන

මගින් සංවිධානය කරනු ලබන වැඩසටහන් පිළිබඳ සවිස්තර තොරතුරු කල් තබා ලබා දිය යුතු බවටත්, විදේශීය නියෝජිතයන්ගේ වීසා ආරක්ෂක අමාත්‍යාංශය සහ සෙසු අධිකාරීන් විසින් විසින් පාලනය කළයුතු බවටත්, විදේශ කටයුතු පිළිබඳ ආමාත්‍යාංශය විසින් යෝජනාවක් ගෙනවැත් ඇතැයි මාධ්‍ය වාර්තා කළෝය. දමිල දේශපාලඥයින් සහ උතුරේ අතුරුදහන් වූවන්ගේ පවුල් විසින් පවත්වන ලද විරෝධතා ව්‍යාපාරයක් මැඩ පැවැත්වීමට පොලීසය සහ ආරක්ෂක හමුදාවන් විසින් උත්සහ දරන ලදී.

රජය විවිවෙචනය කරන ආචාර්යවරුන්ට මරණ තර්ජන එල්ල විය. අත්තඩංගුවට ගැනීම සහ විරෝධතාවයන්ට පහර දීම් හරහා ශිෂ්‍ය මර්දනය දිගින් දිගටම ක්‍රියාත්මක විය. උසස් අධ්‍යපන අමාත්‍යවරයා විසින් ශිෂ්‍ය ක්‍රියාකාරීන් පිස්සන්, මෝඩයන් සහ නරියන් ලෙස හඳුන්වාදෙමින් කළ කතාවක් ප්‍රධාන පෙළේ රූපවාහිනී නාලිකා ප්‍රචාරය කළහ. කොළඹ පාසලක තත්ත්වය පිළිබඳ උද්ඝෝෂණය කළ ගුරුවරුවන් සහ දෙමාපියන්ද ප්‍රහාරයක්ට ලක් විය. එකතරා මහේස්ත්‍රාත් වරයෙක් ශිෂ්‍ය ක්‍රියාකාරීන්ගේ බෙල්ල කැඩිය යුතු බව නිර්දේශ කළ බවත් තවත් මහේස්ත්‍රාත් වරයෙක් කාන්තා ශිෂ්‍ය ක්‍රියාකාරිනියකට ඇය කාන්තාවක් නිසා දේශපානයෙන් වැළකී සිටින ලෙස යෝජනා කළ බවත් "මානව හිමිකම් සුරැකීමේ ශිෂ්‍ය සංවිධානය" සිය වාර්තාවක දක්වා සිටියේය.

පහරදීම්, බිය ගැන්වීම් සහ තර්ජන කිහිපයකට ලක් වූ බෞද්ධ භික්ෂුවකට ලබා දී තිබුණු පොලිස් ආරක්ෂාව හදිසියේම ඉවත් කරනු ලැබූ අතර  පසුව ඔහුව තුවාල සහිතව මාර්ගයක් අයිනේ සිටියෙදී සොයා ගන්නා ලදී.  පැහැර ගැනීම සහ තුවාල  අදාල භික්ෂුව විසින්ම සිදු කර ගත් ඒවා බව කියමින් පොලීසිය විසින් ඔහුව අත්තඩංගුවට ගන්නා ලදී.

සමස්තයක් වශයෙන් ජූනි මාසය, දඬුවම් නොලබන වටපිටාවක් තුළ සුළුතර කණ්ඩායම් සහ රජය විවේචනය කර පුද්ගලයන් විවිධ ආකාරයේ පහරදීම්, බිය ගැන්වීම් , අපකීර්තියට පත් කිරීම් දිගින් දිගටම සිදුවුණු තවත් එක් මාසයක් ලෙස සැළකිය හැකිය.

## A.අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස උල්ලංඝනය කිරීම

### 1. රජය විසින් නිල නොලත් වාරණයක් පැනවීම

ජූනි 15 සහ 16 දිනවලදී අලුත්ගම සහ බේරුවෙළ ප්‍රදේශයන්හි ඇති වූ ජාතිවාදී කෝලහලය වාර්තා කිරීම සම්බන්ධයෙන් වාරණ ලිපියක් සියළුම මාධ්‍ය ආයතන වලට ලබා දී ඇති බව විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කර සිටියේය. දක්වා ඇති ආකාරයට ක්‍රියා කරන ලෙසත් එසේ නොකළ හොත් විද්‍යුත් මාධ්‍ය බලපත්‍ර අහෝසි කිරීමවැනි නීතිමය ප්‍රතිවිපාක වලට මුහුණ දීමට සිදු විය හැකි බවත් එම ලිපියේ සඳහන්ව තිබූ බව විපක්ෂ නායකයා දක්වා සිටියේය[1].



*අලුත්ගම නගරයේ පනවා තිබූ පොලිස් ඇඳිරිනීතිය නොසලකා මුස්ලිම් ප්‍රජාව ආරක්ෂා කරන බවට චෝදනා කරමින් බොදු බල සේනා සහයකයින් ආරක්ෂක හමුදා වෙත විරෝධය පළ කරන ආකාරය(ඡායාරූපය : දිනුක් කොළඹගේ/ අල් ජසීරා)*

### 2. සමාජ ජාල මර්දනය කිරීමට උත්සහයන්

අන්තර්ජාලයේ ක්‍රියාත්මක වන සමාජ වෙබ් අඩවි මර්දනය කිරීම සඳහා විශේෂ නීති සම්පාදන කිරීමට සැළසුම් කර ඇති බව කියමින් ශ්‍රී ලංකා නීතිඥ සංගමය රජයට චෝදනා කළේය. ජාතික සහ ආගමික සංහිඳියාව බිඳ දැමීමට ලිඛිතව සහ වාචිකව ජාතිවාදී සහ ආගම් වාදී ප්‍රකාශ නිකුත් කරන පුද්ගලයින්ට එරෙහිව නීතිය බලාත්මක කරන සේ ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් ගෝඨාබය රාජපක්ෂ මහතා කළ නියෝගය ගෙන හැර පාමින් නීතිඥ සංගමයේ නීතියේ ආධිපත්‍ය පිළිබඳ ස්ථාවර කමිටුවේ සභාපති සහ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා නීතිඥයෝ සංවිධානයේ ප්‍රකාශක ලාල් විජේනායක මහතා ප්‍රකාශ කළේ මෙය සමාජ ජාල හරහා තොරතුරු ගලා ඒම වැළැක්වීමට ගන්නා ලද උත්සහයක් බවයි. ද්වේශ සහගත ප්‍රකාශ නිසි ආකාරයෙන් නිර්වචනය නොකර එවැනි ප්‍රකාශ වලට විරුද්ධ නීති පැනවීම නිෂ්ඵල ක්‍රියාවක් බව විජේනායක මහතා තව දුරටත් පැවසීය[2].

[1]http://www.adaderana.lk/news/video-govt-imposed-unofficial-censorship-to-cover-up-its-sins-ranil-(Last accessed on 12th July 2014)

[2] http://www.ceylontoday.lk/51-67271-news-detail-laws-to-suppress-social-media-planned-basl-alleges.html (Last accessed on 12th July 2014)

### 3. ‘ග්‍රවුන්ඩ් වීව්ස්, කොළඹගේ ආදී වූ ට්විටර් මරුවන් අත්අඩංගුවට ගනු - රාජ්‍ය පාලිත මාධ්‍ය

අලුත්ගම සහ බේරුවෙල ප්‍රදේශයේ ඇති වූ බෞද්ධ මුස්ලිම් කෝලහලය වාර්තා කිරීම මගින් අල් ජසීරා හි කොළඹ වාර්තාකරු දිනොක් කොළඹගේ මහතා ආගමික ආතතිය වර්ධනය කරන බවට චෝදනා කරමින් ඩේලි නිවුස්පුවත් පතේ කර්තෘ රාජ්පාල් අබේනායක මහතා විසින්බිය ගන්වන ආකාරයේ ට්විටර් පණිවුඩ කිහිපයක් මුදා හරින ලද අතර එමගින් කොළඹගේ මහතා සිදුවීම අතිශෝක්තියෙන් වර්තා කරන බවට සහ ඔහු සමාජ ජාල මිනී මරුවෙක් බවට චෝදනා කරන ලදී. අලුත්ගම ප්‍රදේශයේ ඇති වූ මෙම කෝලහලයෙන් සිවු දෙනෙකු මරණයට පත් වූ අතර 80 දෙනෙකු පමණ තුවාල ලැබූහ. කොළඹගේ මහතා ශ්‍රී ලංකාවේ අත්දැකීම් බහුල ජනමාධයවේදියෙකු සහ හෆින්ටන් පෝස්ට් තීරු රචකයෙකු ද වේ. “ග්‍රවුන්ඩ්වීව්ස්[3], කොළඹගේ වැනි ට්විටර් මරුවන් අත්තඩංගුවට ගනු” යනුවෙන් එක් ට්විටර් පණිවුඩයක් මගින් අබේනායක මහතා ඉල්ලා සිටියේය. මෙවැනි ට්විටර් පණිවුඩ කිහිපයක්ම ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ සහ පාලක පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වන ඔහුගේ පුත් ගේ නිල ට්විටර් ගිණුමට පිටපත් කර තිබුණි[4].

### 4. ජාතිවාදී කෝලහලය වර්තාකිරීමට ගිය ජනමාධ්‍යවේදීන්ට තර්ජනය කර සහ රියදුරුට පහර දීම

ජූනි 16 වන දින අලුත්ගම ප්‍රදේශයේදී සන්ඩේ ලීඩර් පුවත්පතේ ජනමාධ්‍යවේදියෙකු වන බිනොයි සූරිආරච්චි මහතාට කලහකාරී පිරිසක් විසින් තර්ජනය කරන ලද අතර ඔහුගේ රියදුරුට පහර දෙන ලදී. ඔහු තවත් ජනමාධ්‍යවේදීන් දෙදෙනෙකු සමග අලුත්ගම ප්‍රදේශයට ගොස් ඇත්තේ ජූනි15 වන දින හට ගත් ජාතිවාදී කෝලහලය වාර්තා කිරීමටය. එහි යන අතරතුර පොලු රැගත් කලහකාරී පිරිසක් විසින් ජනමාධ්‍ය කණ්ඩායම වට කර සූරිආරච්චි මහතා ශරීර ඇපකරුවෙකු ලෙස රදවා ඇත. ඔහුගේ සගයන් කලහකාරී පිරිස සමග සාකච්ඡා කර පසුව ඔහුව නිදහස් කර ගන්නා ලදී. රියදුරු මහතා රෝහල් ගත කෙරුණි[5]. එදිනම සූරිආරච්චි මහතාගේ සහයෙක් සහ රියදුරු විසින් කුරුදු වත්ත පොලීසියේ පැමිණිල්ලක් ගොනු කරනු ලැබූ අතර ජූලි 11 දින වන විටත් ඒ පිළිබද කිසිදු විභාගයක් පවත්වා නොතිබිණ.

### 5. ජාතිවාදී කෝලහලය වාර්තා කිරීමට ගිය ජනමාධ්‍යවේදීන්ට මරණ තර්ජන ; පහරදීම් වලින් බරපතල තුවාල

“එදා රෑ මම මැරෙයි කියලා හිතුවා” යනුවෙන් සන්ඩේ ටයිම්ස් සහ ලංකාදීප පුවත් පතේ ජනමාධ්‍යවේදියෙකු වන සරත් සිරිවර්ධන මහතා කියා සිටියේ[6]. ඒ මහතා එසේ ප්‍රකාශ කළේ ජූනි 15 වන දා අලුත්ගම ප්‍රදේශයේ ඇති වූ ජාතිවාදී කෝලහලය වාර්තා කිරීමට යාමෙන් අනතුරුවය. “සිංහල සහ මුස්ලිම් මිනිස්සු සීයක් විතර මාව වට කර ගෙන පහර දුන්නා. මගේ කැමරාව පැහැර ගෙන පොඩි කරා. මම ප්‍රචණ්ඩව හැසිරුණු සිංහල සහ මුස්ලිම් දෙගොල්ලන්ගේම පින්තූර ගත්තා. ඒ නිසා ඔවුන්

---

[3]An online citizen journalism website that regularly publishes contents critical of the present government. (http://groundviews.org/)
[4]http://www.theaustralian.com.au/news/world/sri-lanka-call-to-arrest-reporter/story-e6frg6so-1226965565934?nk=886e7a60410784c6ae132b150b70b3d8(Last accessed on 12th July 2014)
[5]http://colombogazette.com/2014/06/16/journalist-held-hostage-and-released(Last accessed on 12th July 2014)
[6]http://www.sundaytimes.lk/140622/news/need-for-calm-say-both-sides-104377.html (Last accessed on 12th July 2014)

මට පහර දුන්නා.“ යනුවෙන් ඔහු පැවසුවේය. “මගේ හිසට හයියෙන් යමක් වැදුණා, ඒ සමගම කිහිප දෙනෙක් මට පිටුපසින් පහර දුන්නා. මම බිම ඇද වැටුනා, ඒ පිරිස දිගටම පහර දුන්නා. මගේ ඇඳුම් ඉරා දමා දිගින් දිගටම පහරදුන්නා. මාව මරා දැමිය යුතු බව ඔවුන් කිවුවා.”අවට වෙඩි හඬ ඇසී පහරදුන් පිරිස විසිරී ගොස් ඇති අතර කලහකරුවන් ඉවත් වී යන තුර සිරිවර්ධන මහතා අසල තිබූ වත්තක සැගවී සිට ඇත. ඉන් පසු ඔහු රෝහල් ගත ගත වී ඇත.

## 6. බීබීසි සංදේශය වාර්තාකරු, අල් ජසීරා සහ දේශීය රූපවාහිනී නාලිකාවක ජනමාධ්‍ය කණ්ඩායම් වලට පහර දීම

ජූනි 15 වන දින බීබීසී සන්දේශයෙහි වාර්තාකරුව කලහකාරී පිරිස විසින් තල්ලු කර දමා ජාතිවාදී කෝලහලය වාර්තා නොකරන මෙන් තර්ජනය කර ඇත. ජූනි 16 වන දා අදාල ප්‍රදේශයේ ගමන් කරමින් සිටි දේශීය රූපවාහිනී නාලිකාවක මාධ්‍යවේදීන් කණ්ඩායමකට බාධා එල්ල කළ අතර පහර දීමකින් ඔවුන් බේරුනේ යාන්තමිනි. තුවාල නොලබා ප්‍රචණ්ඩ පිරිස මග හැර යාමට ඔවුන්ට හැකි වූ නමුත් කැමරා ආම්පන්න වලට හානි සිදු විය[7]. ජූනි17 වන දා මතුගම සහ අලුත්ගම ප්‍රදේශයේ ගමන් කරමින් සිටියේදී අල් ජසීරා රූපවාහිනී ජාලයේ ජනමාධ්‍ය කණ්ඩායමද පහර දීමකට ලක් වූ අතර කැරලි කරුවන් විසින් එහි කැමරාකරු අඩත්තේට්ටම් වලට භාජන කොට වාහනයට හානි සිදු කරන ලදී[8].

## 7. ජනමාධ්‍යවේදී පුහුණු වැඩමුළුව අහෝසි කිරීම

මීගමුව ගෝල්ඩ් සැන්ඩ් හෝටලයේදී ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය විසින් දමිල ජනමාධ්‍යවේදීන් වෙනුවෙන් සංවිධානය කළ පුහුණු වැඩමුළුවට ජූනි 07 වන දා කිසියම් සංවිධානාත්මක කණ්ඩායමක් විසින් සිදු කළ විරෝධාවයක් හේතුවෙන් බාධා එල්ල විය. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය ත්‍රස්තවාදීන්ට සහය දක්වන බව සහ මෙම පුහුණු වැඩමුළුව මගින් යුධ අපරාධ සම්බන්ධයෙන් පැවැත්වෙන ජාත්‍යන්තර විමර්ශනය සඳහා සාක්ෂි ලබා දීමට පුහුණු කරන බවට මෙම විරෝධතා කරුවන් චෝදනා කළේය. මෙම වැඩමුළුව නීති විරෝධී හෝ රාජ්‍ය විරෝධී එකක් නොවන බවට බවට ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ නිලධාරීන් ප්‍රකාශ කර සිටියද විරෝධතාකරුවන් විසුරුවා හැරීමට කිසිදු පියවරක් නොගත් පොලීසිය ඒ වෙනුවට වැඩමුළුව අවලංගු කරන ලෙස උපදෙස් දෙන ලදී. මේ ස්ථානයට පැමිණි පොලිස් අධිකාරී ජේ.කේ.එච්. ලියනගේ මහතා වැඩමුළු සංවිධායකයින්ට කියා සිටියේ වැඩමුළුව නවතා දමා සහභාගීවන්නන් මීගමුව ප්‍රදේශයෙන් ඉවත් වන්නේ නම් පමණක් පොලිස් ආරක්ෂා ලබා දිය හැකි බවයි. මෙම වැඩමුළුවට සහභාගීවීමට පැමිණි ජනමාධ්‍යවේදීන් සියළුම දෙනා ජනමාධ්‍ය අමාත්‍යංශය යටතේ ලියාපදිංචි වී එහි අනුමැතිය ලබා ගෙන තිබේ. එබැවින් විරෝධතාකරුවන් කියා සිටි ආකාරයට මෙම වැඩසටහන ත්‍රස්තවාදීන්ට සහය දක්වන්නක් නම් ඒ සඳහා ජනමාධ්‍ය අමාත්‍යංශයද වගකිව යුතු බව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය කියා සිටි යේය. මෙම ජනමාධ්‍යවේදීන් ත්‍රස්තවාදීන් ලෙස හංවඩු ගසා ඇත්තේ ඔවුන් දමිල ජාතිකයන් වන නිසා සහ ඔවුන් දමිල භාෂාවෙන් ජනමාධ්‍යකරණයේ නිරත

[7]http://www.ft.lk/2014/06/18/death-toll-rises-to-4-from-aluthgama-riots/ (Last accessed on 12th July 2014)
[8]Watch video from 0.58 – 1.20 minshttp://www.aljazeera.com/news/asia/2014/06/sri-lanka-riots-prompt-international-concern-201461752248175495.html(Last accessed on 12th July 2014)

වන නිසා බව සංවිධායකයන් අවධාරණය කර සිටියේය. පසුගිය මැයි මාසයේදී ද ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය විසින් පොළොන්නරුවේදී සංවිධානය කළ මෙවැනි වැඩමුළුවක් අත් හැර දැමීමට සිදු විය. එයට හේතු වූයේ ආරක්ෂක හමුදාවන් විසින් හෝටල් කළමණාකාරීත්වට එල්ල කළ තර්ජනයන්ය. කෙසේ වුවත් සිංහල ජනමාධ්‍යවේදීන් වෙනුවෙන් සංවිධානය කළ මේ හා සමාන පුහුණු වැඩමුළු බාධාවකින් තොරව පවත්වාගෙන යාමට හැකි වී තිබේ. දෙවැනි වරටත් සිදු වූ මෙම කඩාකප්පල්කාරී ක්‍රියාව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආතනය විසින් තදබල ලෙස හෙලා දකින ලද අතර වගකිව යුතු පුද්ගලයන් පිළිබඳ නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලෙස රජයට බල කළ සිටියේය[9].




*මීගමුවේදී පැවැත්වීමට නියමිත්ව තිබුණු ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර් නැෂනල් ශ්‍රී ලංකා ආයතනය විසින් සංවිධානය කළ ජනමාධ්‍ය වැඩමුළුව ආක්‍රමණය කළ කළහකාරී කණ්ඩායමේ සාමාජිකයෙක් ජනමාධ්‍යවේදියෙකුට බැණ වදී ආකාරය. කළහකාරී කණ්ඩායම ආරක්ෂා කරමින් ජ්‍යෙෂ්ට පොලිස් නිලධාරියෙක් සිට ගෙන සිටී. (ඡායාරූපය: TISL)*

## 8. හොල්සිම් ආයතනයේ මාධ්‍ය සාකච්ඡාව ජනමාධ්‍යවේදීන්ට තහනම් කිරීම

හොල්සිම් ලංකා ආයතනය විසින් පසුගිය සතියෙහි පවත්වනු ලැබූ සහ එහිදී එහි විධායක නිලධාරී බර්නාඩ් ෆොන්ටානා අදහස් දැක් වූ මාධ්‍ය සාකච්ඡාවට සහභාගී වීමට සන්ඩේ ලීඩර් සහ ඉරුදින පුවත්පත් වල ජනමාධ්‍යවේදීන්ට තහනම් කරන ලදී. සන්ඩේ ලීඩර් පුවත්පත මෑතකදී ස්විස් සිමෙන්ති සමාගමක් වන හොල්සිම් සමාගමේ අනු සමාගමක් වන හොල්සිම් ලංකා ආයතනයේ කළමණාකාරීත්වය පිළිබඳ විවේචනාත්මක ලිපි කිහිපයක් පල කරන ලදී. සන්ඩේ ලීඩර් පුවත්පත කියා සිටියේ හොල්සිම් හි විධායක නිලධාරී බර්නාඩ් ෆොන්ටානා මහතාගෙන් 'අමාරු ප්‍රශ්න' අසන ජනමාධ්‍යවේදීන් මේ මාධ්‍ය සාකච්ඡාවට නොකැඳවීමට හොල්සිම් කළමාණාකාරිත්වය තීරණය කර

[9] http://www.tisrilanka.org/?p=11979(Last accessed on 12th July 2014)

ඇති බවයි. මේ මාධ්‍ය සංකච්ඡාව තෝරාගත් මාධ්‍යවේදීන්ට පමණක් විවෘත් එකක් බව හොල්සිම්හි සන්නිවේදන කළමනාකරු විසින් පිළිගන්නා ලදී[10].

**9.** දමිල ජනමාධ්‍යවේදීන් කොළඹ හෝටලයකින් මහ රෑ එළියට

ජූනි 07 වන දා මීගමුවේදී එල්ල වූ බාධාකිරීම හේතුවෙන් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ආයතනය විසින් වැඩමුළුවට සහභාගීවීමට නියමිතව සිටි ජනමාධ්‍යවේදීන් ව කොළඹ ගලධාරී හෝටලයට රැගෙන යන ලදී. ගලධාරී හෝටලය තෝරා ගන්නා ලද්දේ දැඩි ආරක්ෂාවක් සහිත වටපිටාවක පිහිටා එය පිහිටා ඇති නිසා ය. එනමුත් ජනමාධ්‍යවේදීන් කාමර වලට ඇතුලු කර පැයක තරම් කාලයක් යත්ම හෝටලයෙන් ඉවත්ව යන ලෙස හෝටල් කළමණාකාරිත්වය ජනමාධ්‍යවේදීන්ට දැනුම් දී ඇත. බලගතු සංවිධානයක් විසින් කරන ලද බලකිරීමකට අනුව මෙසේ ජනමාධ්‍යවේදීන්ට ඉවත්ව යන ලෙස දැනුම් දුන් බව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය පසුව කළ ප්‍රශ්න කිරීමකදී හෝටල් කළමණාකාරිත්වය විසින් ප්‍රකාර කර ඇත. ජනමාධ්‍යවේදීන්ව ඉවත් නොකළ හොත් තර්ජනය කරනු ලැබූ කණ්ඩායමේ සාමාජිකයන් පැමිණ ඔවුන්ව ඉවත් කරන බවට තර්ජනය කළ බව හෝටල් කළමණාකාරිත්වය කියා සිටියේය[11].

**10.** රාජ්‍ය පාලිත පුවත්පතක් බර්ට්‍රෝල් බ්‍රෙෂ්ට්ගේ වේදිකා නාට්‍ය වල ඇති දේශපාලන යටි අදහස් පිළිබඳ ලිපියක් වාරණය කිරීම

රාජ්‍ය පාලිත සති අන්ත පුවත්පතක් වන සිළුමිණ පුවත් පතේ ජූනි 15 ප්‍රකාශයේ ශාස්ත්‍රීය අතිරේකය අත් හිටවූ බවට වාර්තා විය. එයට හේතුව ලෙස දැක් වූයේ බර්ට්‍රෝල් බ්‍රෙෂ්ට් ගේ වේදිකා නාට්‍ය වල ඇතුළත් වන ප්‍රබල දේශපාලන සංවාද පිළිබඳ ලියැවුණු ලිපියකි. ශාස්ත්‍රීය අතිරේකයේ කවරයේ කතාව ලෙස පළ වීමට නියමිතව තිබුණු මෙම ලිපිය කුහකත්වය, මර්ධනය සහ දූෂණය සහිත දේශපාලන ව්‍යුහයන් සහිත සමාජ සම්බන්ධයෙන් බ්‍රෙෂ්ට්ගේ වේදිකා නාට්‍ය වල ඇති අදාලතාවය පිළිබඳ සාකච්ඡා කරන්නකි. කෙසේ වුවත් ශ්‍රී ලංකා රජය පිළිබඳ මෙම ලිපියේ කිසිදු සටහනක් නොතිබුණු නමුත් සමස්ථ ව්‍යුහයේම ව්‍යුහාත්මක කඩා වැටීමක් ලෙස දක්වමින් පුළුල් සන්ධර්භයක් තුළ ශ්‍රී ලංකාවේ දේශපාලන යථාර්ථයන් සාකච්ඡා කරනු ලැබීය[12].

**11.** පශ්චාත් යුධ සමය පිළිබඳ සැකසුණු චිත්‍රපටයක් ඉන්දියාවේ දමිල දේශප්‍රේමීන්ගේ තර්ජනයට

ශ්‍රී ලංකාවේ පශ්චාත් යුධ සමය පිළිබඳ සැකසුණු 'ඔබ නැතුව, ඔබ එක්ක' චිත්‍රපටය තමිල්නාඩුවේ දර්ශනය කිරීමෙන් පසුව දමිල දේශප්‍රේමී කණ්ඩායම් වලින් එල්ල වූවා යැයි කියන තර්ජනාත්මක දුරකතන ඇමතුම් හේතුවෙන් චිත්‍රපට ශාලා වලින් ඉවත් කරන ලදී[13]. ඉන්දු ලංකා සහයෝගී නිෂ්පාදනයක් වන මෙම චිත්‍රපටය අධ්‍යක්ෂනය කර ඇත්තේ ප්‍රමුඛ පෙළේ ලාංකික චිත්‍රපටකරුවෙකු වන ප්‍රසන්න විතානගේ විසිනි. මෙම චිත්‍රපටය නැවත දර්ශනය කිරීම සඳහා මැදිහත් වන ලෙස ඉල්ලමින් අධ්‍යක්ෂවරයා සහ නිෂ්පාදකවරුන් විසින් තමිල්නාඩු මහ ඇමති වරයා වෙත ලිපියක් යොමු කර ඇත.

---

[10] http://www.asianmirror.lk/news/item/1563-holcim-bars-sunday-leader-swiss-giant-blatantly-violates-media-freedom(Last accessed on 12th July 2014)
[11] http://www.tisrilanka.org/?p=11979(Last accessed on 12th July 2014)
[12] http://www.asianmirror.lk/news/item/1550-silumina-bans-bertolt-brecht-for-damaging-government-propaganda(Last accessed on 12th July 2014)
[13] http://dbsjeyaraj.com/dbsj/archives/31048 (Last accessed on 12th July 2014)

“මෙම චිත්‍රපටය ශ්‍රී ලංකාවේ පශ්චාත් යුධ සමය සහ දමිල ජනතාවට යුක්තිය අහිමිකිරීමේ ප්‍රති විපාක පිළිබද සංවේදී නිරූපණයක් වේ. හැකි තරම් ඉන්දියානු ප්‍රදර්ශන අවකාශයක් ලබා දීම වෙනුවට අද අපි ඉන් ප්‍රතිවිරුද්ධ දේ අත්දකිමින් සිටිමු. මේ සියල්ලට හේතුව මං මුලා වූ සුළු පිරිසක් විසින් චිත්‍රපටය නොබලා එය දමිල ද්‍රෝහී එකක් බව තීරණය කිරීමයි.”චිත්‍රපටය දර්ශනය කිරීම සදහා පොලිස් ආරක්ෂාවඉල්ලමින් යොමු කළ මේ ලිපිය අදාල නිලධාරීන් විසින් කියවූ බව වාර්තා විය. ජූනි 20 වන දා චෙන්නායි සිනමා ශාලා දෙකකදී මෙම චිත්‍රපටය දර්ශනවාර ආරම්භ කළ බවත් පසු දින චිත්‍රපටශාලා වලට කිසියම් කණ්ඩායමක් විසින් තර්ජනාත්මක දුරකතන ඇමතුම් ලබා දුන් බවත් මේ සිදු වීම පිළිබද පොලීසියට දැනුම් දුන්නත් ඔවුන්ගෙන් කිසිදු සහයෝගයක් නොලැබුණු බවත් චිත්‍රපටයේ එක් නිෂ්පාදකවරයෙකු වන රාහුල් රෝයි පැවසූ බව වාර්තා විය. ප්‍රදේශයේ දමිල කණ්ඩායමක් විසින් එල්ල කරන ලද තර්ජන හේතුවෙන් චිත්‍රපටයේ දර්ශන වාර අත්හිටුවා ඇති බව පී.වී.ආර් සිනමා හි ශිලාධිත්‍ය හෝරා ට්විටර් පණිවුඩයක් යොමු කර තිබුණු බව වාර්තාවිය. අනුග්‍රහය නොමැතිකම හේතුවෙන් මෙම චිත්‍රපටයේ දර්ශනවාර ස්වෙච්ඡාවෙන් අත් හිටවූ බව අනෙක් සිනමා ශාලාව ප්‍රකාශ කර සිටි බව වාර්තා විය. ඒ අතරම පොලීසිය පවසා ඇත්තේ ඔවුන්ට කිසිදු විධිමත් පැමිණිල්ලක් නොලැබුණු බවයි.




*තමිල්නාඩුවේ තහනමට: With You, Without You (ඡායාරූපය - ප්‍රසන්න විතානගේ)*

## B. සමාගමයේ නිදහස උල්ලංඝණය කිරීම්

### 12. රාජ්‍ය නොවන සංවිධානවල වැඩසටහන් වලට පැමිණෙන විදේශීය ආරාධිතයන්ට වන වීසා රෙගුලාසි

රාජ්‍ය නොවන සංවිධාන විසින් පවත්වන ලබන වැඩසටහන් වලට පැමිණෙන විදේශීය ආරාධිතයන්ට වීසා නිකුත් කිරීමේදී අදාල වන නව රෙගුලාසි ඇතුළත් ආඥා පත්‍රයක් කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති බව වාර්තා විය. මෙම ආඥාපත්‍රයට අනුව " වැඩසටහන් සංවිධානය කිරීම සඳහාරාජ්‍ය නොවන සංවිධාන වල ඉල්ලීම සලකා බැලීම සහ විදේශීය ආරාධිතයන්ගේ වීසා සම්බන්ධයෙන් ක්‍රියා කිරීම" ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යංශයේ රා.නො.සං පිළිබඳ ලේකම් කාර්යාලයට සහ සමාගම් ලියාපදිංචි කිරීමේ ලේකම් කාර්යාලයට පැවරෙනු ඇත. ඒ අනුව විදේශීය ආරාධින්ට වීසා ලබා ගැනීම සඳහා සංවිධානයේ ලියාපදිංචි සහතිකය සහ මුදල් ආධාර ලැබෙන මූලයන් පිළිබඳ විස්තරාත්මක තොරතුරු මෙන්ම සාකච්ඡාවට බඳුන් වන තේමා පිළිබඳ කෙටි විස්තරයක්, වැඩසටහනේ අරමුණු සහ සහභාගීවන්නන්ගේ ලැයිස්තුවක් ඉදිරිපත් කළ යුතුය[14].

### 13. දෙමළ අතුරුදහන්වූවන්ගේ ඥාති පිරිස් විරෝධතාවයකට සහභාගී වීමෙන් වළක්වා දෙමළ පළාත්සභා මන්ත්‍රීවරයෙක් අත්අඩංගුවට ගැනීම

මුලතිවු දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඉදිරිපිටදී ජූනි 5 වන දින දමිල ජාතික සන්ධානය (TNA) සහ දමිල ජාතික මහජන පෙරමුණ (TNPF) විසින් ඒකාබද්ධ විරෝධතාවයක් සංවිධානය කරන ලදී. මෙම විරෝධතාවය මගින්, යුද්ධයේ අවසන් දින කිහිපය තුළදී ආරක්ෂක හමුදාවන්ට භාර දීමෙන් පසු අතුරුදහන් වී ඇති බව සැළකෙන පුද්ගලයන් පිළිබඳ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් විසින් ගොනු කරන ලද හබයාස් කෝපුස් නඩු පෙත්සම් විභාගයට ගන්නා ලෙස ඉල්ලමින් මෙම විරෝධතාවය පැවැත්විණි. මෙම විරෝධතාවයට සහභාගීවීමට පැමිණි අතුරුදහන්වූවන්ගේ පවුල් වල සාමාජිකයන්ව ආරක්ෂක හමුදාවන් විසින් විරෝධතාවයට සහභාගීවීම වැළක්වා ලීමට උත්සහ දැරූ බව වාර්තා විය[15]. අධිකරණයට අපහාස කිරීම මත දමිල ජාතික සන්ධානයේ උතුරු පළාත සභාවේ මන්ත්‍රීවරයෙකු අත්අඩංගුවට ගත් බව මාධ්‍ය වාර්තා කළ අතර විරෝධතාවය පැවැත්වෙන ස්ථානය වෙනස් කිරීමෙන් පසුව ඔහුව නිදහස් කර ඇත.

[14]http://www.sundaytimes.lk/140629/columns/five-star-wonder-of-asia-dream-or-nightmare-105246.html(Last accessed on 12th July 2014)
[15]http://www.tamilnet.com/art.html?catid=13&artid=37247(Last accessed on 12th July 2014)

## C. එක්සත් ජාතීන්ගේ යුධ අපරාධ විමර්ශන මණ්ඩලය වෙත සාක්ෂි ලබා දෙන පුද්ගලයන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගන්නා බවට තර්ජනය කිරීම

### 14. එක්සත් ජාතීන්ගේ යුධ අපරාධ විමර්ශන මණ්ඩලය වෙත සාක්ෂි ලබා දෙන පුද්ගලයන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගන්නා ලෙස තර්ජනය කිරීම

අනාගත යුධ අපරාධ විභාගයකදී එකී පරීක්ෂන කමිටුව ඉදිරියේ රජයට විරුද්ධව සාක්ෂි ලබා දෙන පුද්ගලයන් පිළිබද සුදුසු ක්‍රියාමාර්ග ගන්නා බවට රජය තර්ජනය කළ බව ජනමාධ්‍ය වාර්තා කළේය[16]. "මෙම ඉතාම බරපතල තත්ත්වයක් සහ අප එය ඉතා ළගින් නිරීක්ෂණය කරනවා. ප්‍රතිවාදීන් විසින් දෙනු ලබන සාක්ෂි මත ඒ පිළිබද සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට අප සූදානම්." යනුවෙන් රජයේ මාධ්‍ය ප්‍රකාශක සහ ජනමාධ්‍ය අමාත්‍ය කෙහෙලිය රඹුක්වැල්ල මහතා සිලෝන් ටුඩේ පුවත් පතට පවසා තිබුණි. රජය අපකීර්තියට පත් කිරීමට සූදානම් වන ලංකාව තුළ සහ ඉන් පිටත දමිල ඩයස්පෝරාව සහ සෙසු පුද්ගලයන් මෙන්ම ප්‍රධාන දමිලදේශපාලන පක්ෂය වන දමිල ජාතික සන්ධානය පිළිබදවද රජය දන්නා බව අමාත්‍යවරයා පැවසූ බව තව දුරටත් වාර්තා විය.

## D. විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට මරණ තර්ජන, විරොධතා දැක්වූ දෙමාපියන්ට සහ ගුරුවරුන්ට පහර දීම්

### 15. ආචාර්ය නිර්මාල් රංජිත් දේවසිරි මහතාට මරණ තර්ජන

විශ්ව විද්‍යාල ආචාරවරුන්ගේ සංගමයේ හිටපු සභාපති ආචාර්ය නිර්මාල් රංජිත් දේවසිරි මහතා විසින් ජූනි 16 වන දින සිට තමන්ට එල්ල වූ මරණ තර්ජනයක් පිළිබද මහරගම පොලීසියට පැමිණිල්ලක් ගොනු කළ බව වාර්තා විය. ඒ මහතාගේ බිරිදටද තර්ජන එල්ල වී ඇති අතර ජූනි 17 වන දා ලැබුණු දුරකතන ඇමතුමක් මගින් දේවසිරි මහතාගේ දියණියට ඇසිඩ් ප්‍රහාරයක් එල්ල කරන බවට තර්ජන කර ඇත[17]. ආචාර්ය දේවසිරි මහතා වසර ගණනාවක් තිස්සේ වත්මන් රජය ප්‍රසිද්ධියේ විවේචනය කරයි.

### 16. රුහුණ විශ්ව විද්‍යාලයේ ආචාර්යවරුන්ට මරණ තර්ජන

රුහුණු විශ්ව විද්‍යාලයේ ආචාර්යවරුන්ට එල්ල වූ මරණ තර්ජන පිටුපස රජය සිටින බව ජූනි 6 වන දින කොළඹදී පැවති මාධ්‍ය හමුවකදී විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ සංගමයේ සභාපතිවරයා චෝදනා කළේය[18].විශ්ව විද්‍යාලය තුළ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට පහර දීම පිළිබදව දොස් පැවරීමෙන් පසුව ඔවුන්ට තර්ජනය කළ බව පැවසේ. ශිෂ්‍යයන්ට ප්‍රහාර එල්ල කළ මැරයන්ව පොලීසිය විසින් ආරක්ෂා කළ බව

[16] http://dbsjeyaraj.com/dbsj/archives/30626(Last accessed on 15th July 2014)
[17] http://www.lankatruth.com/home/index.php?option=com_content&view=article&id=7119:death-threats-to-dr-nirmal-ranjith-devasiri-&catid=42:smartphones&Itemid=74 (Last accessed on 12th July 2014)
[18] https://www.srilankamirror.com/news/15324-death-threats-to-ruhuna-university-lecturers and http://www.sundaytimes.lk/140608/news/ruhuna-uni-undergrads-to-continue-agitating-for-reopening-of-their-campus-102887.html (Last accessed on 12th July 2014)

මෙලෙස තර්ජනයට ලක් වූ තවත් විශ්වවිද්‍යාල දේශකයෙකු වන ආචාර්ය උපුල් අබේරත්න මහතා මාධ්‍ය වෙත ප්‍රකාශ කළේය[19].




*පාලක පක්ෂයේ දේශපාලඥයින්ගේ සහය ලබන කළහකාරී කණ්ඩායම් විශ්ව විද්‍යාල ගේට්ටුව අසල රැස් වී එහි ආචාර්යවරුන්ට සහ ශිෂ්‍යයන්ට තර්ජනය කරන ආකාරය ( ඡායාරූපය: බීබීසී සංදේශය)*

## 17. විරෝධතා දැක්වූ ගුරුවරුන් සහ දෙමාපියන්ට තර්ජන

කොළඹ අශෝක විද්‍යාලයේ පවතින දේශපාලන අත පෙවීම් පිළිබඳව විරෝධතාවය පළ කළ එය විදුහලේ ගුරුවරුන් සහ දෙමාපියන් ජූනි 05 වන දා නාඳුනන පිරිසකගේ ප්‍රහාරයට ලක් වූ බව වාර්තා විය. ප්‍රහාරයේ ප්‍රතිඵලයක් ලෙස විරෝධතාවයට සහභාගී වූ මවක් කොළඹ ජාතික රෝහලට ඇතුළත් කරන ලදී. වත්මන් විදුහල්පති වරයා විසින් පාසල සහ එහි අධ්‍යාපන කටයුතු විනාශ කරන බවට විරෝධතාකරුවෝ චෝදනා කළහ. රටේ අනාගත ශිෂ්‍ය පරපුරට වඩා රජය සිය හෙංචයියන්ට ප්‍රමුඛතාවය දෙන බව මේ ප්‍රහාරය පිළිබඳ අදහස් දක්වමින් ලංකා ගුරු සංගමයේ මහ ලේකම් ජෝසප් ස්ටාලින් මහතා ප්‍රකාශ කළේය. මේ ප්‍රහාරය සම්බන්ධයෙන් කතා කිරීම පිළිබඳ බස්නාහිර පළාතේ මහ ඇමති වරයා චෝදනාවට ලක් විය[20].

---

[19]https://www.srilankamirror.com/news/15324-death-threats-to-ruhuna-university-lecturers (Last accessed on 12th July 2014)

[20]http://www.lankaviews.com/en/index.php?option=com_content&view=article&id=11677:minister-prasanna-attacks-parents&catid=35:local&Itemid=48(Last accessed on 12th July 2014)

## E. ශිෂ්‍ය ක්‍රියාකාරකම් මර්දනය

### 18. රජරට විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ගේ සත්‍යග්‍රහයට ප්‍රහාර



*ශිෂ්‍යයන්ගේ තාවකාලික උපවාස කුටිය ගිනි ගන්නා ආකාරය (ඡායාරූපය: ලංකා ට්‍රෘත්)*

ශිෂ්‍යයන් 27 දෙනෙකුගේ අසාධාරණ පංති තහනම ඉවත් කරන ලෙස ඉල්ලමින් රජරට විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් විසින් සංවිධානය කළ සත්‍යග්‍රහය පිළිවෙළින් ජූනි 18[21] සහ ජූනි 29 [22] යන දෙදින තුළ නාඳුනන මැර කණ්ඩායමකගේ ප්‍රහාරයට ලක් විය. මැර වරයෝ මෙදින උද්‍යෝගන ශිෂ්‍යයන් සත්‍යග්‍රහය සඳහා යොදා ගත්තාවකාලික කුටියට ගිනි තැබූහ. මෙ සිදුවීමෙන් එක් ශිෂ්‍යයෙකු තුවාල ලැබුවේය. සිදුවීම සම්බන්ධයෙන් පැමිණිල්ලක් ගොනු කළද පොලීසිය විසින් තවමත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බව "මානව හිමිකම් සුරැකීමේ ශිෂ්‍ය සංවිධානය" කියා සිටියේය.

### 19. ශිෂ්‍ය නායකයින් අත්තඩංගුවට

අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ කැඳවුම්කරු ප්‍රකාශ කළ ආකාරයට එහි හිටපු කැඳවුම්කරු සංජීව බණ්ඩාර මහතා සහ තවත් ශිෂ්‍ය නායකයින් තිදෙනෙක් මහනුවර පොලීසිය විසින් ජූනි 23 වන දා අත්අඩංගුවට ගෙන ඇත[23]. මොවුන් මහනුවර මහේස්ත්‍රාත් ඉදිරියට පමුණුවනු ලැබූ අතර ජූලි 23වන දා දක්වා සංජීව බණ්ඩාර මහතා රිමාන්ඩ් බාරයට පත් කරන ලද අතර සෙසු තිදෙනා ඇප මත මුදා හරින ලදී. අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලය දැක්වූ ආකාරයට මොවුන්ව අත්තඩංගුවට ගෙන ඇත්තේ විශ්ව විද්‍යාල ආරක්ෂක නිලධාරීන් විසින් ගොනු කරන ලද අසත්‍ය පැමිණිල්ලක් හේතුවෙන් බව ශිෂ්‍ය ක්‍රියාකාරිකයෙකු ඉන්ෆෝම් වෙත පැවසීය. විශ්ව විද්‍යාල භූමියට ඇතුළු වීමට බණ්ඩාර මහතාට පනවා තිබුණු තහනම කඩ කිරීම වෙනුවෙන් පසුව ඔහුට චෝදනා පවරන ලදී. සංජීව බණ්ඩාර මහතා නිදහස්

---

[21] http://www.lankatruth.com/home/index.php?option=com_content&view=article&id=7125:thugs-attack-students-sathyagraha-&catid=42:smartphones&Itemid=74(Last accessed on 12th July 2014)
[22] http://www.lankaviews.com/en/index.php?option=com_content&view=article& id=11694:sathyagraha-of-rajarata-students-attacked-by- thugs&catid=35:local&Itemid=48 (Last accessed on 18th June 2014)
[23] http://www.dailymirror.lk/news/48838-bandaras-arrest-part-of-witch-hunt-iusf.html(Last accessed on 12th July 2014)

අධ්‍යාපන අයිතීන් වෙනුවෙන් ප්‍රබල හඬක් නගන්නෙකු වන අතර කිහිපවරක් තර්ජන වලට මුහුණ දී අත්අඩංගුවට ද පත් වී ඇත.

**20. රජයේ ප්‍රදර්ශනයක් පිළිබඳව විරෝධතාවය දැක්වූ රුහුණ විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයන්ට ප්‍රහාර** පොලීසිය බලා සිටියෙදී නියෝජ්‍ය අමාත්‍ය සනත් ජයසූරිය මහතාගේ නායකත්වයෙන් මෙහෙය වුණු කළහකාරී කණ්ඩායමක් විසින් ශිෂ්‍යයන් වෙත එල්ල කළ ප්‍රහාරය ශ්‍රී ලංකා නීතීඥවරුන්ගේ සංගමයේ ස්ථාවර කමිටුව විසින් හෙලා දකින ලදී[24]. ජයසූරිය මහතා සහ රජයේ දේශපාලඥයින් ප්‍රහාරයට සම්බන්ධ වී සිටින ආකාරය දැක්වෙන ඡායාරූප ඉදිරිපත් කරමින් ජනතා විමුක්ති පෙරමුණද මෙම පහරදීම හෙළා දකින ලදී[25]. රුහුණු විශ්ව විද්‍යාල භූමියේ පැවැත්වීමට සූදානම් කර ඇති රජය මගින් වාර්ෂිකව සංවිධානය කරනදැයට කිරුල ප්‍රදර්ශණය පිළිබඳ ශිෂ්‍යයින් දැක්වූ විරෝධතාවය ජූනි 02 වන දින එල්ල වූ මෙම ප්‍රහාරයට හේතු වූ බව කියැවුණි[26]. ශිෂ්‍යයන්ට පහර දීම සම්බන්ධයෙන් වූ චෝදනාව නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් ප්‍රතික්ෂේප කරන ලද නමුත් ශිෂ්‍යයන්ට එරෙහිව ප්‍රදේශවාසීන් විසින් සිදු කළ විරෝධතාවයකට තමන් සම්බන්ධ වූ බව කියා සිටියේය[27].

**21.** ශිෂ්‍ය ක්‍රියාකාරිණියකට එරෙහිව විනය පරීක්ෂණ සහ විශ්ව විද්‍යාල භූමියට ඇතුළු වීමට තහනමක්

කැළණි සරසවියේ ප්‍රමුඛ පෙළේ ශිෂ්‍ය ක්‍රියාකාරිණියක් වන ශ්‍යාමලී ලියනාරච්චි මෙනෙවිය ජූනි 26 වන දින විනය පරීක්ෂණයක් සඳහා කැවනු ලැබූ අතර පරීක්ෂණය අවසන්වන තුරු විශ්ව විද්‍යාල භූමියට ඇතුළු වීම තහනම් කරන ලදී[28].

ශිෂ්‍යාවන් අතර නොසන්සුන්තාවය අවුළුවන බවට වූ චෝදනාව ඇයට එල්ල කරන ලද්දේ තනිකරම ශිෂ්‍යාවන් විසින් දියත් කළ ඒකාබද්ධ ක්‍රියාමාර්ගයක් හරහා නව නව කාන්තා නේවාසිකාගාරයක් දිනා ගැනීමට කැළණිය විශ්ව විද්‍යාල ශිෂ්‍යාවෝ සමත්වීමෙන් පසුය. ඊට පෙර පැවති කාන්තා නේවාසිකාගාරය ඉතාමත් අඩු පහසුකම් සහිත වූවක් අතර එක් කාමරයක ශිෂ්‍යාවන් 25 දෙනෙකුට පමණ ලැගුම් ගැනීමට සිදු ව තිබුණි.

මීට ඉහදී ශ්‍යාමලී මෙනෙවිය සහ තවත් ශිෂ්‍ය ක්‍රියාකාරිණියන් දෙදෙනෙකු අධිකරණයේ වැළැක්වීමේ නියෝග නොකතා පැවැත්වුණු ශිෂ්‍ය විරෝධතා ව්‍යාපාරයකට සහභාගී වීම හේතුවෙන් අත්අඩංගුවට ගන්නා ලදී[29]. ශ්‍යාමලී මෙනෙවිය අධිකරණයට ඉදිරිපත් කළ අවස්ථාවේදී අනාගතයේදී දේශපාලන ක්‍රියාකාරකම් වලට සම්බන්ධ නොවන ලෙස මහරමහේස්ත්‍රාත් විසින් අවවාද කරන ලදී. විශේෂයෙන්ම

---

24 https://www.colombotelegraph.com/index.php/bar-association-condemns-police-inaction-during-ruhuna-university-attack/ (Last accessed on 12th July 2014)
25 http://www.srilankanews.lk/index.php/news/general-news/3538-master-blaster-blasts-students-jvp (Last accessed on 12th July 2014)
26 http://www.srilankanews.lk/index.php/news/general-news/3538-master-blaster-blasts-students-jvp (Last accessed on 12th July 2014)
27 http://www.samachar.com/Jayasuriya-accused-of-attacking-students-ogfmMTagfcd.html (Last accessed on 12th July 2014)
28 “Monthly update on repression of students in Sri Lanka” – June edition, by “Students for Human Rights”
29 “Monthly update on repression of students in Sri Lanka” – June edition, by “Students for Human Rights”

ඇය කාන්තාවක් වන බැවින් එවැනි කටයුතු නුසුදුසු බව ප්‍රකාශ විය. කාන්තා නේවාසිකාගාර වටා ශිෂ්‍යාවන් බිය ගැන්වීමට පොල්ලක් රැගෙන යන බවට ඇයට එරෙහිව පදනම් විරහිත චෝදනාවක් ද එල්ල කරන ලදී.

## 22. ශිෂ්‍ය ක්‍රියාකාරීන්ගේ ගෙල කැඩීමට මහේස්ත්‍රාත් නිර්දේශ කරයි

අධිකරණය ඉදිරියට පමුණුවනු ලැබූ ශිෂ්‍ය ක්‍රියාකාරීන් දෙදෙනෙකුගේ ගෙල කඩා දැමීම යුතුව තිබුණු බව කොටුව මහේස්ත්‍රාත් තිලිණ ගමගේ විසින් ජූනි 16 වන දා ප්‍රකාශ කරන ලදී[30]. මෙම ශිෂ්‍යයන් අධිකරණයට ඉදිරිපත් කරනු ලැබුවේ ශිෂ්‍ය ක්‍රියාකාරීන් අත්අඩංගුඅවට ගෙන පහර දීමේ සිදුවීමක් සම්බන්ධයෙනි. පහරදීමෙන් මින් එක් ශිෂ්‍යයෙකුගේ ඇසට බරපතල තුවාල සිදු වී තිබුණි.

## 23. ශිෂ්‍යක්‍රියාකාරීන්ගේ පංති තහනම් කිරීම

නිලධාරීන්ගේ රාජකාරියට බාධා කළා යැයි කියමින් රජරට විශ්ව විද්‍යාලයේ ව්‍යවහාරික පීඨයේ අවසන් වසරේ ශිෂ්‍යයෙකු වන සී.එම්. අමරරත්න මහතා ජූනි 05 වන දින පංති තහනමකට ලක් කරන ලදී[31]. ගම් වාසීන්ගේ ප්‍රහාරයට ලක් වීමෙන් පසුව ආරක්ෂාව ඉල්ලා සිටි ශිෂ්‍ය කණ්ඩායමකට ආරක්ෂාව ලබා දීමට ඔවුන් අපොහොසත් වන්නේ මන්දැයි තමන් ආරක්ෂක නිලධාරීන්ගෙන් විමසූ බව පංති තහනමට ලක් වූ ශිෂ්‍යයා පැවසුවේය. විනය පරීක්ෂණය පිළිබඳ දැනුම් දෙන ලිපිය තමන් වෙත ලැබුණේ මේ සිදුවීමෙන් මාස 4කට පසුව බවත් තමන්ට විරුද්ධව නිශ්චිත චෝදනා කිසිවක් ලිපියේ සඳහන් නොවුණු බවත් හෙතෙම වැඩිදුරටත් කියා සිටියේය. මෙම විනය පරීක්ෂණය සිදු කරන්නේ මීට මාස 4කට පෙර සිදු වූ අදාල සිදුවීම සම්බන්ධයෙන් බව පරීක්ෂණය අතරතුර ඔහුට දැනුම් දී ඇත. ඔහු ඉදිරිපත් කළ කරුණු නොතකා ඔහුගේ විශ්ව විද්‍යාල ජීවිතයේ අවසාන සෙමෙස්තයට අදාල වන මාස 6ක පංති තහනමක් සහ විභාග තහනමක් පනවන ලදී. මෙම සිදුවීමේදී විශ්ව විද්‍යාල බලධාරීන් විනය පරීක්ෂණයක් පැවැත්විය යුතු නියමිත පිළිවෙළ අනුගමනය කර නොමැති බව **"**මානව හිමිකම් සුරැකීමේ ශිෂ්‍ය සංවිධානය**"** ප්‍රකාශ කළේය.

## 24. ශිෂ්‍ය ක්‍රියාකාරීන් අපකීර්තියට පත් කිරීම

උසස් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් ශිෂ්‍ය ක්‍රියාකාරීන් පිස්සන්, මෝඩයන් සහ හිවලන් ලෙස හඳුන්වන ලද[32] අතර ඔවුන් විසින් ඉදිරිපත් කරන කිසිදු ඉල්ලීමකට ඇහුම්කන් නොදෙන බවත් ඔහු ප්‍රතිචාර දක්වන්නේ ශිෂ්‍යයන්ට මිස හිවලුන්ට නොවන බවත් ප්‍රකාශ කරන ලදී. අමාත්‍යවරයාගේ මෙම කතාවට තරයේම විරුද්ධත්වය පාන බව විශ්ව විද්‍යාල ආචාර්ය වරුන්ගේ සංගමයේ සභාපති ආචාර්ය චන්ද්‍රගුප්ත තේනුවර මහතා මාධ්‍යයට ප්‍රකාශ කර සිටියේය[33].

---

[30] "Monthly update on repression of students in Sri Lanka" – June edition, by "Students for Human Rights"

[31] "Monthly update on repression of students in Sri Lanka" – June edition, by "Students for Human Rights"

[32] Original speech in Sinhalese is available at http://www.col4neg.net/newspage/sirasa-news-1st/sirasa-news-1st-7pm-05-06-2014.html (minutes 17.56 to 18.13 of the news broadcast) while the English translation (text and video) which is slight edited, is at http://newsfirst.lk/english/2014/06/allied-health-science-students-issue-will-provide-answers-foxes-s-b-dissanayake/38708 (Last accessed on 12th July 2014)

[33] https://www.srilankamirror.com/news/15324-death-threats-to-ruhuna-university-lecturers (Last accessed on 12th July 2014)

## F. ආගමික නිදහස ප්‍රවර්ධනය කරන මානව හිමිකම් ආරක්ෂකයෙකුට තර්ජන

**25.** වටරැක විජිත හිමියන්ට ලබා දී තිබුණු පොලිස් ආරක්ෂාව ඉවත් කිරීම සහ සිදු කරන ලදැයි කියන පහර දීම



*විජිත හිමි: පැහැරගෙන යාම සහ පහර දීම ?(ඡායාරූපය: නෙත් එෆ් එම් )*

2013 වසරේ සිට විශේෂයෙන්ම සුළුතර කණ්ඩායම් වල ආගමික නිදහස වෙනුවෙන් පෙනී සිටින විජිත හිමියන් බොදු බල සේනාවේ ක්‍රියාකාරකම් දැඩිව විවේචනය කළ බෞද්ධ භික්ෂුවකි. මෙම හිමි නම් පසු ගිය කාලය තුළ පහරදීම් වලින් තුවාල ලැබූ අතර, බිය වැද්දවීම්, අපකීර්තියට පත්කිරීම් වලටද මුහුණ දුන්නේය. තවද ඔහුට ප්‍රාදේශීය සභා සැසිවාර වලට සහභාගී වීමට බධා එල්ල කෙරුණු අතර සහ ඔහු විසින් සංවිධානය කළ මාධ්‍ය හමුවකටද පොලීසිය ඉදිරිපිටදී බාධා එල්ල කරන ලදී. මෙම සිදුවීම් සියල්ලම සම්බන්ධයෙන් බොදු බල සේනාව වග කිව යුතු බව සාක්ෂි වලින් පෙනෙන්නට තිබුණි[34]. ජනාධිපතිවරයා ඇතුළු දේශපාලඥයන් රාශියකට සහ පොලිස්පති වරයා ඇතුළු පොලීසිය වෙත කරන ලද පැමිණිළි සහ ඉල්ලීම් ගණනවකගෙන් අනතුරුව ඔහුට පොලිස් ආරක්ෂාව ලබා දෙන ලදී. කෙසේ වෙතත් කිසිදු දැනුම් දීමකින් තොරව ජූනි 07 වන දින ඔහුට ලබා දී තිබුණු පොලිස් ආරක්ෂාව ඉවත් කරන ලදී. ඔහු විසින් සංවිධානය කරන ලද මාධ්‍ය හමුවට බාධා එල්ල කිරීම සම්බන්ධයෙන් ගොනු කර තිබූ නඩුව කොටුව මහේස්ත්‍රාත් ඉදිරියේ සලකා බැලුණු අවස්ථාවේදී බොදු බල සේනාවේ නායක ඥානසාර හිමියන් “මේ බල්ලා කෝ” යනුවෙන් අසා සිටියේය. “ඌව මරලා හිරේ ගියානම් හොදයි” යනුවෙන් ඔහු තවදුරත් පැවසුවේය. බොදු බල සේනාවේ නායකයා විසින් විජිත හිමියන් වෙනුවෙන්

[34] See http://groundviews.org/2014/06/20/did-the-bbs-attack-vijitha-thero-again/ and http://groundviews.org/2013/10/09/buddhist-monk-attacked-by-bodu-bala-sena-and-police-inaction/ (Last accessed on 13th July 2014)

පෙනී සිටින නීතිඥවරයාටද "බල්ලා"යනුවෙන් අමතන ලදී[35]. ජූනි 19 වන දා උදැසන දරුණු තුවාල සහිතව විජිත හිමියන්ව මාර්ගයක් අසලදී සොයා ගන්නා විට ඔහුගේ ඇඳුම් ඉරා දමා අත පය ගැට ගසා තිබුණි. රෝහල ගත කිරීමෙන් පසුව සිය හිත මිතුරන් මෙන්ම නීතිඥවරයා පවා නිදහසේ මුණ ගැසීමට විජිත හිමියන්ට අවසර නොදෙන ලදී. ඔහුගේ ගිලන් ඇඳ අසල පොලිස් නිලධාරීන් රඳවා තබන ලදී. මෙම සිදුවීම පිළිබඳ අසත්‍ය පැමිණිල්ලක් තමා විසින්ම සිදු කළ බවත් තුවාල තමන් විසින්ම සිදු කර ගත් බවත් විජිත හිමියන් පිළිගත් බව පොලීසිය පසුව ප්‍රකාශ කළේය[36]. මේ සඳහා සාක්ෂි තමන් සතුව ඇති බව පොලීසිය ප්‍රකාශ කළ අතර රෝහලෙන් නිදහස් වූ වහාම ඒ හිමියන්ව අත්තඩංගුවට ගන්නා ලදී. ඉදිරිපත් කර තිබුණු චෝදනා ඇප ලබා දිය හැකි ඒවා වුවත් විජිත හිමියන්ව ඇප මත මුදා හැරීම පානදුර මහේස්ත්‍රාත් වරයා විසින් දෙවරක් ප්‍රතික්ෂේප කළේය. ජූලි 10 වන දින විජිත් හිමියන්ව ඇප මත මුදා හරින ලද අතර තමන්ට පැහැරගෙන ගොස් පහර දුන් බව අසත්‍යයක් නොවන බව ඔහු ජනමාධ්‍යයට කියා සිටියේය[37].

## G. ජාතිවාදී කෝලහලයෙන් අනතුරට ලක් වූ පුද්ගලයන්ට සහය වූ පක්ෂයේ දේශපාලඥයෙකුට ප්‍රහාර

### 26. විරුද්ධ පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වන පාලිත තෙවරප්පෙරුම මහතාට තුවාල, වාහනයට දැඩි හානි

ජූනි 16 වන දා දර්ගා නගරයේදී කිසියම් කලහකාරී පිරිසක් තමන්ට පහර දුන් බව එක්සත් ජාතික පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වන පාලිත තෙවරප්පෙරුම මහතා කියා සිටියේය[38]. මෙම සිදුවීම සිදුවූයේ ඇඳිරිනීතිය පනවා තිබූ කාලය අතර තුර බව ප්‍රකාශ කළ ඒ මහතා පොලීසිය සහ විශේෂ කාර්ය බලකාය බලා සිටියෙදී සිය වාහනයද ඔවුන් විසින් විනාශ කළ බව තව දුරටත් කියා සිටියේය. අනාථ වූ ජනතාව පිළිබඳ සොයා බැලීමට තමන් දර්ගා නගරයට පැමිණි අවස්ථාවේදී කඩු සහ පොලු රැගත් පිරිසක් කාන්තාවන් සහ කුඩා දරුවන් කණ්ඩායමක් මරා දැමීමට උත්සහ දරමින් සිටි බවත් ඔවුන්ව ආරක්ෂා කිරීම සඳහා වාහනයෙන් බැස එම පිරිස වාහනයට නංවා ගත් බවත් මන්ත්‍රී වරයා මාධ්‍යවලට පවසා තිබුණි. එම අවස්ථාවේදී මැරයන් තමන්ට පහර දී තුවාලසි දු කළ බවත් සිය වාහනය විනාශ කළ බවත් ඔහු පවසා ඇත.

[35] http://www.dailymirror.lk/news/48186-counsel-says-vengnanasara-thera-insulted-him.html and http://www.srilankanews.lk/index.php/news/general-news/3585-bbs-insulted-me-lawyer-complaints- (Last accessed on 12th July 2014)
[36] http://newsfirst.lk/english/2014/06/venerable-watareka-vijitha-thero-abducted-police-media-spokesperson/41185 (Last accessed on 13th July 2014)
[37] http://groundviews.org/2014/06/26/ven-wataraka-theros-last-statement-before-his-arrest-with-english-subtitles/(Last accessed on 13th July 2014)
[38] http://www.lankasrinews.com/view.php?22qKH303dOK4e2HqGcb2a1Jdd3175bc3qD8e43Vf20235Co3, http://www.dailymirror.lk/opinion/172-opinion/49654-unfortunate-riots-were-not-by-chance.html and http://lankaenews.com/English/news.php?id=14285(Last accessed on 15th July 2014)